# දහම් පාසල් අධ්‍යාපනය කෙරෙහි සිසුන් දක්වන ආකල්ප පිළිබඳ මනෝවිද්‍යාත්මක අධ්‍යයනයක්

# [A psychological study on students' attitudes towards Dhamma school education]

**Ethiliwewe Deepananda**[1]

## Abstract

In order to facilitate the task of conducting social relations by any society to its new members, it is called task education, which presents the evaluations, beliefs, values and certain symbolic things accepted by that society. Here, a unique values learning process takes place through Dhamma school education and the main objective of this investigation was to study the attitudes of the students. In any education, the attitudes shown by the students are different and depending on the nature of the attitudes, negative attitudes and positive attitudes can be seen. Accordingly, this study is based on the study of negative and positive attitudes of students towards Sunday school education. To achieve that objective, a sample of 40 students was selected and among these students between the ages of 10 and 17 were selected. A mixed sample was administered to include students who frequently attend Sunday school and students who rarely attend Sunday school. Methods such as questionnaires, interviews, and observations were used to collect data for this study and qualitative and quantitative research methods were used to interpret the data. A questionnaire based on children's attitudes towards Dhamma school education was selected for the quality of the study. Parents' opinions were also obtained for the correctness of the students' information and since this study was done within the temple environment, it was also easy to conduct the research. Therefore, the quality of the data collected also led to transparency. According to this research, it was found that there are more students who come to Sunday school of their own accord, and students who do not come to Sunday school due to factors such as extra classes and lack of clothes were also identified. Through this study, it was evident how students have a positive attitude towards Dhamma school education and suggestions were made for the promotion of Dhamma school education.

**Key words:** Attitudes, Dhamma School, Education, Psychology, Students

1. Temporary Lecturer, Department of Social Sciences and Comparative Studies, Bhiksu University of Sri Lanka.
E-mail:deepanandaethiliwewe@gmail.com https://orcid.org/0009-0006-9377-3767

Received: 9 Feb. 2024, Accepted revised version: 20 June 2024.
This work is licensed under a Creative Commons Attribution-Share A like 4.0 International License.

**සාරසංක්ෂේපය**

ආගමික පරිසරය කේන්ද්‍ර කරගනිමින් සංවර්ධනය වී ඇති දහම් පාසල් අධ්‍යාපනය, වර්තමානයේ දී දහම් පාසල්, පිරිවෙන් සහ භික්ෂු අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන විධිමත් අධ්‍යාපනයකි. ප්‍රපඤ්ච ලෝකය ඇසුරු කරගනිමින් වැඩෙන ළමයා ආගම දහම සහ සංස්කෘතිය පැවරීමේ සංස්ථාවක් වන දහම් පාසලෙන් තම ආකල්ප මනා සේ දියුණු කරගැනීමට මාර්ගෝපදේශන ලබාගනියි. දහම් පාසල් අධ්‍යාපනය පිළිබඳ වත්මන් සංකල්පය ධනාත්මක නො වේ යන සංකල්පය ඉස්මතු වෙමින් පවතින කාලයක දහම් පාසල් ළමයින්ගේ පැමිණීම ඉතා දුර්වල මට්ටමක පවතී. දහම් පාසල් අධ්‍යාපනයෙන් පාසල් ශිෂ්‍යයෙකු තුළ මනෝ සාමාජීය යහ පැවැත්මක් ඇති කරන බවට පෙන්වා දී ඇති අනාවරණයන් හඳුනා ගැනීම මෙහි ලා වැදගත් ය. දහම් පාසල මඟින් මනා සාරධර්ම අධ්‍යාපනයකට අඩිතාලම වැටී ඇතත් දිනෙන් දින ළමයින් දහම් පාසල් අධ්‍යාපනයෙන් දුරස්වන බවට ප්‍රධානාචාර්ය හිමිවරුන් පවා යම් කනස්සලු ස්වභාවයකින් අදහස් ප්‍රකාශ කරන අතර එම කරුණු සැලකිල්ලට ගනිමින් පර්යේෂණයේ ප්‍රධාන ගැටලුව ලෙස දහම් පාසල් අධ්‍යාපනය පිළිබඳ සිසුන් දක්වන ආකල්ප මොනවා ද? යන්න විමසා බලන ලදි. දහම් පාසල් අධ්‍යාපනය පිළිබඳ සිසුන් දක්වන ආකල්ප පිළිබඳ මනෝවිද්‍යාත්මක අධ්‍යයනයක් සිදු කරමින් ඒ පිළිබඳ ව පවතින ධනාත්මක සහ ඍණාත්මක ආකල්ප හඳුනා ගැනීම මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ විය. මෙම පර්යේෂණය ගුණාත්මක සහ ප්‍රමාණාත්මක පර්යේෂණ ක්‍රම දෙක ම හෙවත් මිශ්‍ර පර්යේෂණ ක්‍රමවේදය භාවිතයට ගනිමින් සිදු කෙරන අතර එහි දී ප්‍රමාණාත්මක දත්ත සහ ගුණාත්මක දත්ත වෙන් වෙන් වශයෙන් රැස් කර එම දත්ත විශ්ලේෂණය කරමින් එම දත්ත සසඳමින් අර්ථකථනය කිරීම ද සිදු කරන ලදි. අධ්‍යාපනයේ ගුණාත්මක භාවය විධිමත් අධ්‍යාපනයක පවතින වැදගත් ලක්ෂණයක් වන බැවින් දහම් පාසල් සිසුන් මඟින් එ පිළිබඳ ඔවුන් දක්වන ආකල්ප සහ ඍණාත්මක ආකල්ප පවතින්නේ නම් එකී තත්වයන් සඳහා පසුබිම් වී ඇති හේතු සාධක විමර්ශනයට ද මෙම පර්යේෂණය වැදගත් වේ. බොහෝ සිසුන් ආගමික පරිසරයක දහම් අධ්‍යාපනය ලැබීමට රුචිකත්වයක් දක්වනවා සේ ම තම ගෘහාශ්‍රිත ව නොමැති දැඩි මානසික නිදහසක් ද විඳිනු පෙනේ. තම සම වයස් මිතුරන් විවිධ අපචර්යයාවන් සඳහා පෙලඹෙන අවස්ථාවන්හි දී දහම් පාසල් අධ්‍යාපනයට යොමු වූ දරුවන් ඔවුන් එම චර්යාවන්වලින් මුදවා ගැනීම සඳහා ද පෙරමුණ ගන්නා බවට සාකච්ඡා මඟින් අනාවරණ විය.



මුඛ්‍යපද: අධ්‍යාපනය, ආකල්ප, දහම් පාසල, මනෝවිද්‍යාව, සිසුන්


**හැඳින්වීම**

සාරධර්ම අධ්‍යාපනය ලබාදීමෙහි ලා සුවිශේෂී කාර්යභාරයක් සිදු කරනු ලබන දහම් පාසල් අධ්‍යාපනය, හෙන්රි ස්ටීල් ඕල්කට්තුමන්ගේ ආභාසයත් සමඟ ආරම්භ වූ සුවිශේෂී අධ්‍යාපන මධ්‍යස්ථානයන් ය. එහෙත් දහම් අධ්‍යාපනයට සරිලන වටපිටාව මිහිඳු මහරහතන් වහන්සේගේ ලංකාගමනයත් සමඟ සැකසුණු අතර එතැන් පටන් පාසල් අධ්‍යාපනයේ සාර්ථකත්වය සඳහා ද සතිමත් මානසිකත්වයක් සහිත දරුවෙකු නිර්මාණය කිරීමේ පුරෝගාමී මධ්‍යස්ථාන සේ ක්‍රියාත්මක වෙයි. ආගමික පරිසරය කේන්ද්‍ර කරගනිමින් සංවර්ධනය වී ඇති දහම් පාසල් අධ්‍යාපනය, වර්තමානයේ දී දහම් පාසල්, පිරිවෙන් සහ භික්ෂු අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන විධිමත් අධ්‍යාපනයකි. ආකල්ප යන්නෙන් "පුද්ගලයෙකු යම් දෙයක්, වස්තුවක්, සංසිද්ධියක්, යම් අදහසක් හෝ යම් ජීවියකු පිළිබඳ දරන මානසික ස්වභාවයක් හෙවත්

ස්ථාවරය අදහස් කෙරෙන අතර" එය තව දුරටත් අර්ථකථනය කිරීමේ දී "ආකල්ප යනු යම් වස්තුවකට හෝ අවස්ථාවකට ප්‍රතිචාර දැක්වීමේ දී මඟ පෙන්වනු ලබන හෝ ගතික බලපෑමක් ඇති කරනු ලබන අත්දැකීමකින් සංවිධානය වන මානසික හා ස්නායුමය සූදානම පිළිබඳ තත්වයකි." (Allport, 1935) ළමයින්ගේ ආකල්ප සංවර්ධනය කිරීම සහ ප්‍රතිපෝෂණයත් මනා මනෝ සාමාජීය යහපැවැත්මක් සහිත දරුවෙකු නිර්මාණය කිරීමත් දහම් පාසල් අධ්‍යාපනයේ ප්‍රමුඛ කාර්යක් වේ. ප්‍රපඤ්ච ම ලෝකය ඇසුරු කරගනිමින් වැඩෙන ළමයා ආගම දහම සහ සංස්කෘතිය පැවරීමේ සංස්ථාවක් වන දහම් පාසලෙන් තම ආකල්ප මනා සේ දියුණු කර ගැනීමට මාර්ගෝපදේශන ලබාගනියි. දහම් පාසල් අධ්‍යාපනය පිළිබඳ වත්මන් සංකල්පය ධනාත්මක නො වේ ය යන සංකල්පය ඉස්මතු වෙමින් පවතින කාලයක දහම් පාසල් ළමයින්ගේ පැමිණීම ඉතා දුර්වල මට්ටමක පෙනේ. ගුරුවරයාට ඉගැන්වීම් ක්‍රියාවලිය සාර්ථක කර ගැනීමට මෙන් ම ශිෂ්‍යයාට ද ඉගෙන ගැනීමේ ක්‍රියාවලිය සාර්ථක ව සිදු කර ගැනීම සඳහා අදහසක්, රුචිකත්වයක්, අරමුණක් පැවතිය යුතු ය. මෙම අධ්‍යයනය සිසුන් දහම් පාසල් අධ්‍යාපනය පිළිබඳ දක්වනු ලබන ආකල්ප සාකච්ඡා කරන ලද අධ්‍යයනයක් වන අතර ගුණාත්මක හා ප්‍රමාණාත්මක පර්යේෂණ සැලැස්ම ඔස්සේ විශ්ලේෂණය කොට ඇත.

**සාහිත්‍ය විමර්ශනය**

දහම් පාසල් අධ්‍යාපනය පිළිබඳ බහුල ව සිදු කරන ලද පර්යේෂණ පිළිබඳ සාහිත්‍ය විමර්ශන වාර්තා නො වේ. එසේ වුවත් ආගමික පරිසරය ඇසුරු කරගත් අධ්‍යාපනය පිළිබඳ පර්යේෂණ අනාවරණය කරගත හැකි ය. දහම් පාසල් අධ්‍යාපනයෙන් පාසල් ශිෂ්‍යයෙකු තුළ මනෝ සාමාජීය යහ පැවැත්මක් ඇති කරන බවට පෙන්වා දී ඇති අනාවරණයන් හඳුනා ගැනීම මෙහි ලා වැදගත් ය.

එහි දී ශිෂ්‍යයාගේ ආධ්‍යාපනික ජයග්‍රහණ කෙරෙහි ආගමික අධ්‍යයනයට සහභාගී වීමේ බලපෑමේ න්‍යායික පසුබිම කුමක් ද යන්න තේරුම් ගත යුතු ය. එය ආගමික ක්‍රියාකාරකම් අධ්‍යයනය කිරීම සහ අධ්‍යාපනය ලබා ගැනීම ප්‍රධාන වශයෙන් ආනුභවික නම්, ආනුභවික විශ්ලේෂණය මෙම සන්දර්භයේ න්‍යායික පසුබිමක් මත පදනම් වේ. Fan (2008) ගේ තර්කය අනුව මිනිසුන්ගේ ආගමික සහභාගීත්වය තීරණය වන්නේ ඔවුන් ආගමික විශ්වාස කෙරෙහි දක්වන සැලකිල්ල මත බව පවසයි.

Azzi and Ehrenberg (1975) and 1975 & Iannaccone (1990,1998) අනුව රාමුව තුළ පුද්ගලයන්ගේ වර්තමාන ආගමික සහභාගීත්වය පුද්ගලයෙකුගේ" ආගමික මානව ප්‍රාග්ධනය" වැඩි කරන අතර එමඟින් පුද්ගල උපයෝගීතාව ද වැඩි කරයි. එසේ ම, පවතින න්‍යායික සාහිත්‍යය අධ්‍යාපනය ආගමික කටයුතු හා සම්බන්ධ බව ගම්‍ය වන අතර ආගමික කටයුතු වෙනත් සමාජ සාධක සමඟ සම්බන්ධ වේ.

Jeynes (2003) පෙන්වා දී ඇත්තේ ආගමික වශයෙන් කැපවී සිටින නාගරික දරුවන් ජාතිය සහ ස්ත්‍රී පුරුෂ භාවය පාලනය කිරීමේ දී පවා ඔවුන්ගේ අඩු ආගමික සගයන්ට වඩා බොහෝ ආධ්‍යාපනික ක්‍රියාමාර්ගවල වඩා හොඳින් ක්‍රියා කළ බව යි. නාගරික සහ අනෙකුත් දරුවන්ගේ අධ්‍යයන ජයග්‍රහණ කෙරෙහි ආගමික බලපෑම තක්සේරු කරන ලද අධ්‍යයනය අනුව එය වඩාත් තහවුරු වී ඇත. තව ද මෙම අධ්‍යයනය සඳහා 1992 ජාතික අධ්‍යාපන කල් පවත්නා සමීක්ෂණ (NELS) දත්ත කට්ටලය භාවිතකර ඇති අතර ප්‍රතිඵල තව දුරටත් පෙන්වා දී ඇත්තේ ආගමිකත්වය සඳහා වන බලපෑම් සාමාන්‍යයෙන් නාගරික දරුවන්ට වඩා වැඩි බව යි. ආගමික වශයෙන් කැපවී සිටින දරුවන්ගේ සමාජ ආර්ථික තත්වය, ස්ත්‍රී පුරුෂ භාවය සහ ශිෂ්‍යයා පෞද්ගලික ආගමික පාසලකට ගියේ ද? යන්න

පාලනය කිරීමේ දී පවා ඔවුන්ගේ අඩු ආගමික සගයන්ට වඩා බොහෝ අධ්‍යයන ක්‍රියාමාර්ගවල වඩා හොඳින් ක්‍රියා කර ඇත (Jeynes,1999) Mayer) Sharp (1962). ආගමික සිසුන් නිර්භීත බවත් ආධ්‍යාපනික වශයෙන් වඩා හොඳ දස්කම් දක්වන බවත් පෙන්වා දී ඇත (Mooney 2010) Jeynes (2005) Jeynes (2007). පවතින සාහිත්‍යයට අනුව ශිෂ්‍යයන්ගේ සාර්ථකත්වයට ආගමේ ධනාත්මක බලපෑමක් ඇති බව සොයාගෙන ඇත. එබැවින් දහම් පාසල් අධ්‍යාපනය යනු ශිෂ්‍යයකුගේ පාසල් අධ්‍යාපනය ද ඉහළ නැංවීමේ සාධකයක් ලෙස ද සම්බන්ධ වී ඇති බව පෙනේ.

නිපුණතා මූලික අධ්‍යාපන ක්‍රමවේදය යටතේ ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිපුණතා පහක් හඳුන්වා දී ඇති අතර දහම් පාසල් අධ්‍යාපනයෙන් පහත දක්වා ඇති කුසලතා සහිත දරුවකු බිහි කරන බව දක්වා ඇත (National Education Commission, 2010).

i. සන්නිවේදන කුසලතා - Communication Skills
ii. පාරිසරික කුසලතා - Skills relevant to the Environment
iii. මූලධර්ම සහ ආගමික කුසලතා - Skills relevant to Principles and Religion
iv. ක්‍රීඩා සහ විවේක කුසලතා - Sport and Leisure Skills
v. ඉගෙනුම් කුසලතා - Skills of Learning to Learn

ගුරු-ශිෂ්‍ය සබඳතාව අධ්‍යාපන කාලය පුරාවට ම සිසුන්ගේ ආකල්ප ධනාත්මක කරගැනීම සඳහා උපකාරි වන අතර ආගමික පරිසරය ඒ සඳහා සමාජ, චිත්තවේග, චර්යා සහ ශාස්ත්‍රීය දියුණුව පිණිස සෘජු දායකත්වයක් ලබාදෙයි (Arbeu, Coplan, Weeks, 2010; Birch and Ladd, 1997; Murray and Greenberg, 200,2001).

ශිෂ්‍ය අධ්‍යාපනයෙහි සාර්ථකත්වය සඳහා ආකල්ප ප්‍රබල දායකත්වයක් ලබාදෙයි. අධ්‍යයන සාර්ථකත්වයට බලපාන පොදු සාධකය එය යි (Das, Halder, Mishra & Debnath, 2014). ඕනෑම අධ්‍යාපන ආයතනයක් හෝ අධ්‍යාපන ක්‍රමවේදයක් සම්බන්ධයෙන් සිසුන් දරන ආකල්ප ධනාත්මක හෝ සෘණාත්මක වුව ද සංස්ථාවේ ඉදිරි පැවැත්මට වැදගත් කාර්යභාරයක් සිදු කරනු ලබයි. බොහෝ ගුරුවරුන් සිසුන්ගේ ආකල් පසෙකලා ඔවුන්ගේ සාර්ථකත්වය සහ අසාර්ථකත්වය තීරණය කරනු ලබයි (Kinniard,2010). ආගමික පරිසරයේ දී ක්‍රියාත්මක වන අධ්‍යාපනය ශිෂ්‍ය ආකල්ප ක්‍රමවත් සහ ධනාත්මක කිරීමෙහි ලා මැදිහත්කරුවකු වන අතර ආධ්‍යාත්මික හිඩැස් පිරවීමෙහි ලා මූලික කාර්යභාරයක් සිදු කරනු ලබයි (සිං සහ මලික්, 2016).

මේ අනුව ආගමික පරිසරයක ගොඩනැගෙන අධ්‍යාපන ක්‍රමවේදය සෙසු ක්‍රියාවලීන් සඳහා ද අඩිතාලමක් සපයන අතර ඉගෙනුම් පරිසරය සහ ඉගෙනුම් ක්‍රමවේදය සම්බන්ධයෙන් සිසුන් දරන ආකල්ප අදාළ අංශයන්හි සාර්ථකත්වය සඳහා දායක වන අයුරු ඉහත පර්යේෂණ මඟින් අනාවරණය කර ඇත. මේ අනුව දහම් පාසල් අධ්‍යාපනය සම්බන්ධයෙන් ද සිසුන්ගේ ආකල්ප ධනාත්මක ද සෘණාත්මක ද යන්න මෙම අධ්‍යයනයෙන් විමසා බැලේ.

**පර්යේෂණ ගැටලුව**

දහම් පාසල් අධයාපනය පිළිබඳ වර්තමානයේ දී දෙමව්පියන් තුළ සෘණාත්මක අදහස් පවතින බව නිරීක්ෂණ සහ සාකච්ඡාවලින් නිරන්තරයෙන් මතුවන සාධකයකි. එහි දී දහම් පාසල් අධ්‍යාපය පිළිබඳ අනවබෝධය සහ අරමුණු සහගත බවකින් තොර ව දහම් පාසල් යැවීමට දෙමව්පියන් පෙලඹී ඇති බව පෙනේ. පාසල් අධ්‍යාපනය පිළිබඳ ධනාත්මක

අදහසක් පැවතීමත් එනිසා ඉරුදින දහම් පාසල් මග අරවා හෝ අමතර පන්ති හෙවත් උපකාරක පන්ති (Extra Class) යාමට පෙලඹීමක් ළමයින්ගෙන් දැකිය හැකි ය. දහම් පාසල් පැමිණීමට අවශ්‍යතාවක් ඇතත් ඒ සඳහා යොමු නොවන්නේ කිනම් හේතු සාධක නිසා දැයි සොයා බැලීම අත්‍යාවශ්‍ය සාධකයක් සේ පෙනේ. දහම් පාසල මඟින් මනා සාරධර්ම අධ්‍යාපනයකට අඩිතාලම වැටී ඇතත් දිනෙන් දින ළමයින් දහම් පාසල් අධ්‍යාපනයෙන් දුරස්වන බවට ප්‍රධානාචාර්ය හිමිවරුන් පවා යම් කනස්සලු ස්වභාවයකින් අදහස් ප්‍රකාශ කරන අතර තත් කරුණු සැලකිල්ලට ගනිමින් පර්යේෂණයේ ප්‍රධාන ගැටලුව ලෙස දහම් පාසල් අධ්‍යාපනය පිළිබඳ සිසුන් දක්වන ආකල්ප මොනවා ද? යන්න විමසා බලන ලදි. සිසුන් දරනු ලබන ආකල්පයන් සඳහා බලපෑ සාධක මොනවා ද? යන්නත් ඔවුන් සතු ස්වයං යෝජනා මොනවා ද? යන්නත් පර්යේෂණයේ ප්‍රධාන ගැටලුව සමඟ සමගාමී වෙමින් සාකච්ඡා කර ඇත.

### පර්යේෂණ අරමුණු

දහම් පාසල් අධ්‍යාපනය පිළිබඳ සිසුන් දක්වන ආකල්ප පිළිබඳ මනෝවිද්‍යාත්මක අධ්‍යයනයක් සිදු කරමින් ඒ පිළිබඳ ව පවතින ධනාත්මක සහ සෘණාත්මක ආකල්ප හඳුනා ගැනීම මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ විය. එය වඩාත් විධිමත් ව අධ්‍යයනය කිරීම සඳහා සුවිශේෂී අරමුණු ඔස්සේ ගොඩනඟන ලදි.

1. සිසුන් දහම් පාසල් අධ්‍යාපනය පිළිබඳ දක්වන ආකල්ප හඳුනා ගැනීම
2. සිසුන් දක්වන සෘණාත්මක ආකල්ප සඳහා හේතු සාධක විමසා බැලීම
3. දහම් පාසල් අධ්‍යාපනය පිළිබඳ ව ධනාත්මක ආකල්ප සංවර්ධනය සඳහා යෝජනා ඉදිරිපත් කිරීම

යථෝක්ත අරමුණු සාධනය කරගනු වස් මෙම පර්යේෂණය සිදු කිරීම අපේක්ෂා කෙරේ.

### පර්යේෂණ ක්‍රමවේදය

මෙම පර්යේෂණය ගුණාත්මක සහ ප්‍රමාණාත්මක පර්යේෂණ ක්‍රම දෙක ම හෙවත් මිශ්‍ර පර්යේෂණ ක්‍රමවේදය භාවිතයට ගනිමින් සිදු කෙරන අතර එහි දී ප්‍රමාණාත්මක දත්ත සහ ගුණාත්මක දත්ත වෙන් වෙන් වශයෙන් රැස් කර එම දත්ත විශ්ලේෂණය කරමින් එම දත්ත සසඳමින් අර්ථකථනය කිරීම ද සිදු කරන ලදි.

මෙම පර්යේෂණයෙහි නියැදිය ලෙස කොළඹ කලාපයට අයත් දහම් පාසල්වල සිසුන් 40ක් යොදාගත් අතර අහඹු නියැදිකරණය යටතේ නියැදියට අවශ්‍ය වන සිසුන් තෝරාගන්නා ලදි. මෙහි දී ශ්‍රේණි වශයෙන් දහම් පාසල්වල 8 ශ්‍රේණියේ සිට දහම් පාසල් අවසාන ශ්‍රේණිය දක්වා වූ සිසුන් පමණක් තෝරාගත් අතර කලාතුරකින් සහ නිතර ම දහම් පාසල් පැමිණෙන සිසුන් ඇතුළත් වන සේ නියැදිය සකසන ලදි.

දත්ත රැස් කිරීම සඳහා ප්‍රශ්නාවලියක් ලබා දුන් අතර සම්මුඛ සාකච්ඡා සහ නිරීක්ෂණය වැනි ක්‍රමවේද ද මේ සඳහා යොදාගත් අතර එම දත්ත විශ්ලේෂණය සඳහා Excel මෘදුකාංගය භාවිතයට ගන්නා ලදි. ඒ ඔස්සේ දත්ත විස්තරාත්මක විශ්ලේෂණයකි. අර්ථකථනය කරන ලදි.

### පර්යේෂණයේ වැදගත්කම

දහම් පාසල් අධ්‍යාපනය සඳහා ළමයින්ගේ යොමුව වර්තමානයේ දී යම් පසුබෑමකට ලක් ව ඇති බවක් පෙන්නුම් කරන අතර දහම් පාසල සඳහා පැමිණීම පිළිබඳ ගැටලුකාරී ස්වභාවයක් සහ ක්‍රියාකාරීත්වය පිළිබඳ මන්දගාමී බවක් පෙන්නුම් කරයි. ඒ සඳහා බලපෑ හේතු සාධක විමර්ශනය සඳහා මෙම පර්යේෂණය බෙහෙවින් ම වැදගත් වේ. දහම් පාසල් අධ්‍යාපනයේ

ගුණාත්මක භාවය පිළිබඳ පසු විපරමක් සඳහා මෙම අධ්‍යනය වැදගත්වන අතර එහි දී ශිෂ්‍යයා කේන්ද්‍ර කරගනිමින් ගුරුවරයා සහ උගන්වන දේ පිළිබඳ ව ද තත්ව පරීක්ෂාවකට එළඹිය හැකි වීම මෙම පර්යේෂණයේ ඇති තවත් සුවිශේෂීත්වයකි.

අධ්‍යාපනයේ ගුණාත්මක භාවය විධිමත් අධ්‍යාපනයක පවතින වැදගත් ලක්ෂණයක් වන බැවින් දහම් පාසල් සිසුන් මගින් එ පිළිබඳ ඔවුන් දක්වන ආකල්ප සහ සෘණාත්මක ආකල්ප පවතින්නේ නම් එකී තත්වයන් සඳහා පසුබිම් වී ඇති හේතු සාධක විමර්ශනයට ද මෙම පර්යේෂණය වැදගත් වේ.


ශිෂ්‍යයා යනු අධ්‍යාපනයේ ඇති හර පද්ධතිය අනාගත ලොවට සම්ප්‍රේෂණය කරවිය හැකි විශේෂිත ම වූත් ඵලදායි වූත් කාර්යක්ෂම වූත් මාධ්‍යක් වන බැවින් ඒ සඳහා බාධා පිණිස පවතින ආකල්ප හඳුනා ගැනීම සඳහාත් එවන් ආකල්ප වෙනස් කිරීම සඳහා ඉදිරිපත් කළ හැකි යෝජනා පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම සඳහාත් මෙම පර්යේෂණය වැදගත් වේ.

**සාකච්ඡාව**

මෙම අධ්‍යයනයේ දී පළමු ව අවධානය යොමු වූයේ දහම් පාසල් අධ්‍යාපනය සඳහා සිසුන් යොමු වූයේ කාගේ අවශ්‍යතාව මත ද යන්න විමසීම යි. යම් ක්‍රියාවලියකට ප්‍රවේශවීමේ දී ආකල්පයන්හි ස්වභාවය බෙහෙවින් ම වැදගත් වේ. එහි දී අධ්‍යාපනය වැදගත්ම ක්‍රියාවලියක් වන අතර අධ්‍යාපන මනෝවිද්‍යාඥයන්ට අනුව ඉගෙනීම් රුචිකත්වය සඳහා ආකල්ප සෘජු බලපෑමක් කරයි. දහම් පාසල් අධ්‍යාපනය පිළිබඳ ළමයින් දක්වන ආකල්ප විමසීම සඳහා තෝරාගත් සිසුන් 40න් සිසුන් 24 දෙනෙක් හෙවත් 76.9%ක ප්‍රතිශතයක් ම තමන්ගේ අවශ්‍යතාව මත දහම් පාසලට පැමිණෙන අතර සිසුන් දහ දෙනෙක් හෙවත් 15.4% ක ප්‍රතිශතයක් පමණක් පැමිණෙන්නේ දෙමව්පියන්ගේ අවශ්‍යතාව මත ය. එයිනුදු සිසුන් හය දෙනෙක් හෙවත් 7.7%ක ප්‍රතිශතයක් වෙනත් හේතු සඳහා පැමිණෙන බව දක්වා ඇති අතර සම්මුඛ සාකච්ඡාවල දී අනාවරණය වූයේ අසල්වැසි ළමයින් යන බැවින් නොයා බැරිකමට තමනුත් යන බව යි.

**රූප සටහන 1:**

**සිසුන් දහම් පාසල් අධ්‍යාපනයට යොමු වීම**





**මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත**

ඉහත පරිදි බොහෝ සිසුන් තම අවශ්‍යතාව මත දහම් පාසලට පැමිණෙන බව අනාවරණය වීම ධනාත්මක පැතිකඩක් ලෙස සඳහන් කළ හැකි අතර එසේ කිනම් හේතුවකට හෝ දහම් පාසලට පැමිණීමෙන් ද සිසුන් බලාපොරොත්තු වන සාධක විෂයෙහි ද පර්යේෂණයේ අවධානය යොමු විය. දෙමව්පියන් සේ ම සිසුන්ට ද අධ්‍යාපනය ලැබීමෙන් තමා බලාපොරොත්තු වන දේ පිළිබඳ ව පවතින ආකල්ප වැදගත් හෙයින් දහම් පාසල් අධ්‍යාපනයට යොමු වීමෙන් ද සිසුන් බලාපොරොත්තු වන දේ පිළිබඳ අවධානය යොමු විණි.

රූප සටහන 2:

**සිසුන් දහම් පාසලට පැමිණීමේ අරමුණු**





**මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත**

දහම් පාසල් අධ්‍යාපනයෙහි වැදගත්කම සම්බන්ධයෙන් ශිෂ්‍යයාට ඇති අවබෝධය අතිශයින් ම වැදගත් ය. එකී අවබෝධය මනා දහම් අධ්‍යාපනයක් ලබා ගැනීම සඳහා ශිෂ්‍යයාට ස්වයං මෙහෙයවීමක් සිදුවීමක් නිරායාසයෙන් සිදු කරන නිසා ය. මෙහි දී සිසුන් 40 ම ප්‍රතිචාර දක්වා ඇති පරිදි යහපත් ගතිගුණ පුරුදුවීමට දහම් පාසලට පැමිණෙන බැව් දක්වා ඇත. ප්‍රශ්නාවලිය යොමු කිරීමේ දී දහම් පාසල් අධ්‍යාපනය පිළිබඳ යාවත්කාලීන වූ තොරතුරු ද සැලකිල්ලට ගනිමින් සැකසූ අතර එහි දී දහම් පාසල් අධ්‍යාපනය නගා සිටුවීමේ අරමුණින් ඉදිරිපත් කර ඇති යෝජනාවක් වන දහම් පාසල් අධ්‍යාපනය ලැබීම අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ බුද්ධ ධර්ම ප්‍රශ්න පත්‍රයට ලකුණු එකතුවීමක් යන්න සැලකිල්ලට ගනිමින් යොමු වීම සිදු විය. එහෙත් බොහෝ සිසුන් ඒ පිළිබඳ කිසිඳු ප්‍රතිචාරයක් නොදක්වා තිබූ අතර ලකුණු ලබා ගැනීමටත් වඩා ආකල්ප සංවර්ධනය ම අරමුණු කරගෙන පැමිණීමක් දකින්නට ලැබුණි.

මෙම පර්යේෂණය සිදු කිරීමේ දී අනාවරණය වූ සුවිශේෂී කාරණා අතර දහම් පාසල් පැමිණීම සඳහා උවමනාව ඇතත් පැන නගින ඇතැම් ගැටලු ඔවුන්ගේ යොමුවීම වළකා ඇති බව විද්‍යමාන වීම පෙන්වාදිය හැකි ය. පර්යේෂණ දත්ත අනුව සිසුන් බොහෝ පිරිසක් අමතර පන්ති යෙදීම නිසා දහම් පාසල් නොපැමිණීම හෝ විවේක කාලයේ දී දහම් පාසලින් බැහැර වීම වැනි සාධක ඉස්මතු විය. ඇතැම් සිසුන් නිල ඇඳුම් නොමැතිකම නිසා ද තවත් පිරිසක් වෙනත් හේතූන් නිසා ද නොපැමිණීම හෝ ඉඳ හිට පැමිණීමට පෙලඹෙන බව පෙනේ. මෙහි දක්වා ඇති වෙනත් හේතු ගණයට දහම් පාසල් යෑම අත්‍යාවශ්‍ය නො වන දෙයක් බවට දෙමව්පියන්, දහම් පාසල් නොයන මිතුරන් මතු කරනු ලබන සාධක ද සෙනසුරාදා දින අමතර පන්තිවලට සම්බන්ධ වීමටත් නිදහසේ සිටීමට ඇත්තේ ඉරිදා දිනයක් පමණක් වන නිසාත් වැනි සාධක අන්තර්ගත වන බව සම්මුඛ සාකච්ඡා මඟින් අනාවරණය විය. පහත දක්වා ඇත්තේ මෙකී සාධක පිළිබඳ විශ්ලේෂණය යි.

රූප සටහන 3:

**සිසුන්ට දහම් පාසල් පැමිණීමට අවශ්‍යතාව ඇතත් නොපැමිණීමට හේතු**





**මූලාශ්‍රය: සමීක්‍ෂණ දත්ත**

පර්යේෂණයේ දී ළමයින් පැමිණීමේ කාලය සහ ඒ අතර කාලයේ දී ලබාගත් දහම් අධ්‍යාපනය පිළිබඳ ව සැලකිලිමත් වූ අතර එය තක්සේරු කිරීම පිණිස අවම වශයෙන් දහම් පාසල් ශිෂ්‍ය ප්‍රතිඥාව හා දහම් පාසල් ගීතය මතකයෙන් කීමට හැකි ද යන්න විමසීමක් ප්‍රශ්නාවලිය සඳහා ඇතුළත් කරන ලදි.

රූප සටහන 4:

**සිසුන් දහම් පාසලට පැමිණීමේ කාලය**




**මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත**

එහි දී තෝරාගත් සිසුන් 40න් වැඩි පිරිසක් දහම් පාසල් පැමිණීමට ආරම්භ කොට අවුරුද්දකටත් වැඩි කාලයක් ගත වූ අය වන නමුත් දහම් පාසල් ශිෂ්‍ය ප්‍රතිඥාව හෝ දහම් පාසල් ගීතය මතකයෙන් ඉදිරිපත් කළ හැකි එකදු සිසුවෙක් නොවීම සුබවාදී නොවන්නක් බව අනාවරණය විය. සම්මුඛ පරීක්ෂණ ඇසුරින් ලබාගත් දත්තවලට අනුව දහම් පාසල් ගීතය සහ ශිෂ්‍ය ප්‍රතිඥාව හඩපටයක් ඇසුරින් දැමීම, සිසුන් ලවා ඉදිරිපත් නො කිරීම, එම විශේෂාංග සඳහා අවකාශයක් වෙන් නොකිරීම වැනි සාධක මතු විය.

මෙම පර්යේෂණයට අනුව සැලකිය හැකි මට්ටමක ළමයින් ප්‍රමාණයක් දහම් අධ්‍යාපනය ලැබීම සඳහා යොමුවන බැවින් දහම් පාසල් ගුරු භූමිකාව පිළිබඳ සිසුන් දක්වන ආකල්පය දැනගනු වස් ප්‍රශ්නාවලිය ඔස්සේ දහම් පාසල් ගුරුවරයෙකු වීමට ඇති රුචිකත්වය පිළිබඳ අවධානය යොමු කරන ලදි.

රූප සටහන 5:

**දහම් පාසල් ගුරුවරයෙකු වීම පිළිබඳ සිසුන්ගේ ආකල්ප**




**මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත**


ඉහත දත්ත අනුව දහම් පාසල් ගුරුවරයෙකු වීම සඳහා සිසුන් තුළ ධනාත්මක ආකල්ප පවතිනු විද්‍යමාන විය. එ පිළිබඳ අදහස් විමසීමේ දී තමන් ඉගෙනගත් දහම් පාසල යන හැඟීම, ආගමික පරිසරයට ඇති ළැඳියාව, නායකත්ව කුසලතා සංවර්ධනය කරගැනීම, චරිත සංවර්ධනය වැනි අදහස් පදනම් වී ඇති බව අනාවරණය විය. එසේ ගුරුවරයෙකු නොවීමට අදහස් ඇති සිසුන් විමසීමේ දී මාසික වැටුපක් නොවීම, දීමනා අවම වීම, වෙනත් රැකියා අභිලාෂ, දෙමව්පියන්ගේ අකැමැත්ත වැනි හේතු සාධක මතු විය.

ඕනෑ ම ශිෂ්‍යයෙකුට තමා ඉගෙන ගන්නා පරිසරය සහ ක්‍රමවේදය පිළිබඳ නිදහස් ආකල්ප දැරිය හැකි අතර ඒ සඳහා අවස්ථාව ද හිමිවිය යුතු ය. ඒ සඳහා ඕනෑම අයෙකුට අයිතිවාසිකමක් ඇත. ඒ අනුව දහම් පරිසරය සහ ඉගැන්වීම් ක්‍රමවේදය පිළිබඳව විමසීමේ කාරණා ද සහිත ව පළමු ව අවධානය යොමු වූයේ දහම් පාසල්වල දැකීමට අකැමැති දේ පිළිබඳ ය. එහි දී බොහෝ සිසුන්ගෙන් බුද්ධිමය සංවාදයක් ගොඩ නැඟුණු බව විද්‍යාමාන වූයේ දහම් පාසලින් අයහපත් චර්යයා රටා, අසමගිකම් සහ දහම් පාසල් නොපැමිණ සිටීම වැනි අදහස් මඟිනි. මෙයට අමතරව පහත සඳහන් පරිදි දහම් පාසලෙහි පිරිසිදු භාවය, ගුරුවරුන්ගේ අවශ්‍යතාව වැනි විධිමත් යෝජනා ද සිසුන් ඉදිරිපත් කරන ලදි.

දහම් පාසලේ දී වැඩි රුචිකත්වයක් දක්වන මත පිළිබඳ විමසීමේ දී ද බොහෝ සිසුන් දරන ලද්දේ සමඟිකම, උගන්වන රටාව, යහපත් චර්යා, උදෑසන රැස්වීම, විවිධ පිංකම් පැවැත්වීම, ශ්‍රමදාන පැවැත්වීම වැනි ධනාත්මක ආකල්ප ය. ඒ අනුව සමස්තයක් වශයෙන් ගත් කල බොහෝ සිසුන් දහම් පාසල් අධ්‍යාපනය පිළිබඳ

**රූප සටහන 6:**

**දහම් පාසල පිළිබඳ සිසුන්ගේ යෝජනා**




**මූලාශ්‍රයඃ සමීක්‍ෂණ දත්ත**

ධනාත්මක ආකල්පයන් දරන බව ප්‍රත්‍යක්ෂ වූ අතර ම ආගමික පරසරයක යහපත් චර්යා රටා පැවතිය යුතු ය යන ධනාත්මක ආකල්ප ද විද්‍යමාන විය.

**සමාලෝචනය**

සිසුන් කවරාකාරයකින් හෝ වුව ද දහම් පාසල් අධ්‍යාපනය වෙත යොමු වුව ද දහම් පාසල් අධ්‍යාපනය පිළිබඳ සෘණාත්මක ආකල්පයන් නොදැරීම සාධාරණ ය. එයට හේතුව නම් මෙම අධ්‍යයනය සඳහා පාලිත කණ්ඩායම් තෝරා ගන්නා ලද්දේ කොළඹ වැනි අතිශය සංකීර්ණ සේ ම විෂම චර්යා බහුල පොකුරු ගම්මාන ආශ්‍රිත ව වන බැවින් පවතින දැඩි සමාජීය පීඩන දරා ගැනීමට සුදුසු පරිසරයක් ද නො වේ. මෙනිසා බොහෝ සිසුන් ආගමික පරිසරයක දහම් අධ්‍යාපනය ලැබීමට රුචිකත්වයක් දක්වනවා සේ ම තම ගෘහාශ්‍රිත ව නොමැති දැඩි මානසික නිදහසක් ද විඳිනු පෙනේ. තම සම වයස් මිතුරන් විවිධ අපචර්යාවන් සඳහා පෙලඹෙන අවස්ථාවන් හි දී දහම් පාසල් අධ්‍යාපනයට යොමු වූ දරුවන් ඔවුන් එම චර්යාවන්වලින් මුදවා ගැනීම සඳහා ද පෙරමුණ ගන්නා බවට සාකච්ඡා මගින් අනාවරණ විය. ඒ අතර විවිධ පිංකම් සඳහා සම්බන්ධ කරවා ගැනීම, දහම් පාසල් අධ්‍යාපන චාරිකාවලට සහ දහම් පාසල් අධ්‍යාපනයෙන් ලැබෙන ප්‍රතිලාභ පිළිබඳ ව දැනුවත් කිරීම වැනි පියවර ක්‍රම විය. විශේෂ ම කාරණාව වනුයේ පවතින දැඩි ආර්ථික දුෂ්කරතාවලට එදා වේල සරිකර ගැනීමට නොහැකි හෙයින් දෙවේලක් හෝ පියවා ගැනීමේ අටියෙන් සිය දහම් පාසල වෙත යොමු කළ බවට ඇතැම් මව්පියන්ගේ සානුකම්පිත අදහස් මතු වීම යි. එහෙත් දහම් අධ්‍යාපනය පිළිබඳ වඩාත් ධනාත්මක රුචිකත්වය ඇති කරනු වස් මනෝ විද්‍යාත්මක ක්‍රම වේදයක් වන ධනාත්මක උපස්ථම්භන (Positive Reinforcement) යොදා ගැනීමට හැකි ය. නිදසුනක් ලෙස ලස්සන ම මල් වට්ටිය, හොඳ ම පැමිණීම, විනීතම ශිෂ්‍යයා, හොඳ ම විශේෂාංගය වැනි ක්‍රමවේද පෙන්වා දිය හැකි සේ ම දහම් පාසල යනු විෂයානු බද්ධ දැනුමෙන් ම පමණක් සිසුන් තුළ ආගම දහම, තුණුරුවන් පිළිබඳ පැහැදීම් ඇති කරවන තැනක් නොවිය යුතු ය. විශේෂිත අවස්ථා වන අලුත් අවුරුදු උත්සව, වෙසක්, පොසොන්, ඇසළ උත්සව, කඨින පිංකම් සහ විවිධ ප්‍රසංග මඟින් දරුවන් ආනන්දයෙන් ප්‍රඥාවට මෙහෙයවිය හැකි අතර එවන් වූ ප්‍රායෝගික දැනුමෙන් ද දහම් පාසල් අධ්‍යාපනය පිළිබඳ වැඩි රුචිකත්වයක් දරුවන්ට ඇති කරවිය හැකි ය.

## මූලාශ්‍රය


අතුකෝරාල, ඩී.ආර්, (2015) *මුල් ළමා වියේ දරුවන්ට ඉගැන්වීමේ නව ක්‍රම*, බොරැල්ල: ශික්ෂා මන්දිර ප්‍රකාශන.

අබේපාල, ආර්, (2011) *අධ්‍යාපන මාර්ගෝපදේශය හා උපදේශනය*, කොට්ටාව: සාර ප්‍රකාශන.

නිශ්ශංක, එච්.එස්.එස්, (2004) *බෞද්ධ මනෝ චිකිත්සාව*, කොළඹ 11: සීමාසහිත ඇම්.ඩී ගුණසේන සහ සමාගම.

බාලසූරිය, එස්. ඒ, (2019) *සාරධර්ම අධ්‍යාපනය*, කොට්ටාව: සාර ප්‍රකාශන.

A. A. Candeias, N. Rebelo, M. Oliveria and P. Mendes, (2010) “Pupils’ attitudes and motivation toward learning and school – study of exploratory models on the effects of socio-demographics, personal attributes and school characteristics,” Research Gate, Vol. 1, No. 1, pp. 1-18.

All Ceylon Buddhist Congress, (1990-2011) Annual General Meeting Reports of All Ceylon Buddhist Congress. Colombo, ACBC.

All Ceylon Buddhist Congress, (2011) Reflections on the Progress of All Ceylon Buddhist Congress Colombo, ACBC.

A. R. Ifeoma, (2016) "Assessment of students" attitude and perception of teaching practice: the case of undergraduates of Delta State University, Abraka,” World Journal of Education, Vol. 6, No. 2, pp. 82-91.

D. Blazar and M. A Kraft, (2017) “Teacher and teaching effects on students’ attitudes and behaviors,” Sage Journals, Vol. 39, No. 1, pp. 146-170.